ඉන්දියා - ශ්‍රී ලංකා පදනම

**පුවත්පත් නිවේදනය**

**ඉන්දියා ශ්‍රී ලංකා පදනම ව්‍යාපෘති යෝජනා කැඳවයි**

ඉන්දියා - ශ්‍රී ලංකා පදනම (ISLF) ආර්ථික, විද්‍යා සහ තාක්ෂණික සහ සංස්කෘතික සහයෝගීතාවය ඉහළ නැංවීම තුළින් ඉන්දු - ශ්‍රී ලංකා සබඳතා ශක්තිමත් කිරීම සඳහා සහ දෙරට ජනතාව අතර අවබෝධය ඉහළ නැංවීම සඳහා 1998 වසරේදී ඉන්දියානු සහ ශ්‍රී ලංකා රජයන් අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමක් මගින් පිහිටුවන ලදී.

2. ඉන්දියා - ශ්‍රී ලංකා පදනම කලාව සහ සංස්කෘතිය, අධ්‍යාපනය, කෘෂිකර්මය, පර්යේෂණ, විද්‍යා සහ තාක්ෂණය, සෞඛ්‍යය, සාමාජීය කාර්යයන්, සංවර්ධන අධ්‍යයන, සංචාරක කර්මාන්තය යන ක්ෂේත්‍රයන්හි සහ පිළිගත් අධ්‍යාපන ආයතනවල වෙනත් අධ්‍යාපනික කාර්යයන් සඳහා ව්‍යාපෘති යෝජනා කැඳවයි. ඉන්දියා - ශ්‍රී ලංකා පදනම ශිෂ්‍යයන්, විද්වතුන්, ශාස්ත්‍රඥයින්, වෘත්තිකයන් සහ කලාකරුවන් සම්බන්ධ සංචාර සහ හුවමාරු සඳහා ද යෝජනා කැඳවයි. සම්මන්ත්‍රණ/වැඩමුළු, කලා ප්‍රදර්ශන, සිනමා උළෙල, සංස්කෘතික වැඩසටහන් සහ පුහුණු වැඩමුළු යනාදිය සඳහා සහභාගී වීම, ඉහත දක්වා ඇති අංශයන් හි ඉන්දු - ශ්‍රී ලංකා සබඳතා පිළිබඳ පර්යේෂණ පළ කිරීම සහ ඉන්දියානු භාෂාවන්ගෙන් ලියැවුණු පොත පත ශ්‍රී ලංකා භාෂාවන්ට සහ ශ්‍රී ලංකා භාෂාවන්ගෙන් ලියැවුණු පොතපත ඉන්දියානු භාෂාවන්ට පරිවර්තනය කිරීම සහ පළ කිරීම ආදී දේ සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කළ හැකිය.

3. තනි පුද්ගලයන්ට, ආයතනයන්ට සහ කණ්ඩායම්වලට ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කළ හැකි අතර ඒවා 2026 අගෝස්තු මස පැවැත්වෙන පැවැත්වෙන ඉන්දියා - ශ්‍රී ලංකා පදනමේ අධ්‍යක්ෂ මණ්ඩල හමුවේ දී සලකා බැලෙනු ඇත.

4. මේ සඳහා වන අයදුම්පත ඉන්දියා - ශ්‍රී ලංකා පදනමේ වෙබ් අඩවියෙන් (www.islfcolombo.com) බාගත හැකිය. නියමිත පරිදි සම්පූර්ණ කරන අයදුම්පත ව්‍යාපෘති යෝජනාව සමඟ 2026 ජූලි 17 වන දිනට පෙර පහත දැක්වෙන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් සහ යෝජනා පහත දැක්වෙන ඊ- මේල් ලිපිනයට ද එවිය හැකිය.

ඉන්දියා - ශ්‍රී ලංකා පදනම
ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය භාරේ
36-38, ගාලු පාර, කොළඹ 03
දුරකථන අංකය:+94 11 2389924
ඊ- මේල්: islfcolombo2@gmail.com